**ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි  හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි  සැලැසුම්  කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන්  සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි (ශ්‍රීලංරාඅගිප්‍ර 01) 27 වැනි ඡේදයට පටහැනිව, සභාවේ ගිණුම් පොත්වල සටහන් කිරීමකින් තොරව රු. මිලියන 7.36 ක් වටිනා ප්‍රදර්ශන භාණ්ඩ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි (ශ්‍රීලංරාඅගිප්‍ර 07) 11 වැනි ඡේදය ප්‍රකාරව දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් සිදුකල යුතු හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වීමට පෙර නිසි පරිදි ගිණුම්කරණ කටයුතු සිදු කර ඇත. ඉහත භාණ්ඩ ප්‍රදර්ශන භාණ්ඩ ලෙස ශුන්‍ය අගයක් සහිතව වෙනම ස්ථාවර වත්කම් ලේඛණ තුල පවත්වා ගෙන යනු ලබන අතර, එම භාණ්ඩ සම්බන්ධව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු ද සිදුකරයි. තවද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව මෙම භාණ්ඩ වලට අදාලව හෙලිදරව් කිරීම් සිදුකර නොමැති බව පෙන්වා දී ඇති නමුත් දේපල පිරියත උපකරණ සටහන තුල මෙම ප්‍රදර්ශන භාණ්ඩ ශුන්‍ය අගයක් සහිතව පෙන්වා දී ඇති බැවින් ඒ සඳහා වෙනමම හෙලිදරව් කිරීමක් අවශ්‍ය නොවන බව නියාමන සභාවේ අදහස වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි (ශ්‍රීලංරාඅගිප්‍ර 02) 22 වැනි ඡේදයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුලදී ලද රු.මිලියන 7ක් වටිනා ප්‍රාග්ධන ප්‍රදාන මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහ ලෙස අනාවරණය නොකර, ආයෝජන ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහ ලෙස දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය තුළ නියාමන සභාව වෙත ලද රු.මිලියන 7ක ප්‍රාග්ධන අරමුදල වර්ෂය තුල ප්‍රාග්ධන භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා ලැබුණු අරමුදල් වේ. එබැවින් එය ආයෝජනය ක්‍රියාකාරකම් යටතේ පෙන්වීම නිවැරදි බවද කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක (ශ්‍රීලංරාඅගිප්‍ර 19) 19 හි 76 වැනි ඡේදය ප්‍රකාරව සමාලෝචිත | ඉදිරි ගිණුම් වර්ෂය තුල අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂය අවසානයට විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්වල වටිනාකම සභාව විසින් ගණනය කර නොතිබුණි. තවද, ප්‍රමිතියේ 141 ඡේදය ප්‍රකාරව අදාළ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 දේපළ,පිරියත හා උපකරණ හි 14 (අ) ඡේදය ප්‍රකාරව වත්කම් අයිතමය හා ආශ්‍රිත අනාගත ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන් අස්ථිත්වය වෙත ගලා ඒමේ හව්‍යතාවයක් ඇති විට පමණක් එම වත්කම් මූල්‍ය නොවන වත්කම් යටතේ දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු වුවත් එවැනි හව්‍යතාවයක් නොමැති රු. 111,003 ක් වටිනා උපකරණ 66 ක් කාර්යාල උපකරණ ලෙසත් රු. 26,000 ක් වටිනා උපකරණ 19 ක් විද්‍යුත් උපකරණ ලෙසත් හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නියාමන සභාව පිහිටුවන ලද 2015 වර්ෂයේදී නියාමන සභාවේ පූර්ව ආයතනය වූ පරමාණුක බලශක්ති අධිකාරියෙන් ලැබී තිබුණු ශුද්ධ වටිනාකම රු. මිලියන 14.04 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් 2015 සිට 2020 දක්වා වර්ෂවල සිදුකර තිබුණු රු.මිලියන 14.04 ක ක්ෂය අදාල වර්ෂ වලදී නියාමන සභාවේ ආදායමට එරෙහිව හඳුනා නොගෙන පරමාණුක බලශක්ති අධිකාරියෙන් ලැබුණු සමුච්චිත අරමුදලට එරෙහිව කපා හැරීම හේතුවෙන් අධිකාරියේ සමුච්චිත අරමුදල රු.මිලියන 3.8 ක ඍණ අගයක් ගෙන තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදි වේ . එම වරද 2024 වර්ෂයේ අවසන් ගිණුම තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වමි. | අධිකාරියේ සමුච්චිත අරමුදල් ශේෂයට ගැලපීම් සිදුකර ඍණ ශේෂය නිවැරදි කල යුතුය. |

## 1.6 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 අංක 1 දරණ පරමාණුක ශක්ති ආරක්ෂණ රෙගුලාසිවල අයනීකරණ විකිරණ ආරක්ෂණය පිළිබඳ රෙගුලාසි | | | |
| | (i) 4(1) (අ) රෙගුලාසිය | විකිරණශීලී ද්‍රව්‍ය සන්තකයේ තබාගැනීම ( possession ) සඳහා සභාව විසින් බලපත්‍ර ලබාදිය යුතු වුවත් පොලිස් මූලස්ථානය විසින් 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාවට ආනයනය කර තිබුණු එක්ස් රේ උපකරණ 50 කට අදාලව උපකරණ 50ක් සඳහා 2020 දෙසැම්බර් 31දක්වාත් උපකරණ 35 කට - 2021 2023වර්ෂ දක්වාත් උපකරණ 34කට 2026 - 2024 වර්ෂ දක්වාත් සහ පෞද්ගලික ආයතනයක් විසින් 2019 වර්ෂයේදී ආනයනය කර තිබුණු එක්ස් රේ උපකරණ 16 කට 2019-2021 වර්ෂ දක්වාත් සන්තකයේ තබාගැනීම සඳහා අවශ්‍ය බලපත්‍ර ලබා දී නොතිබුණි.මේ හේතුවෙන් බලපත්‍ර ගාස්තු ලෙස අයකල යුතු රු .මිලියන 1.38ක් අයකර නොතිබුණි.තවද රෙගුලාසිය ප්‍රකාරව විකිරණ උපකරණවල ක්‍රියාත්මකභාවය අත්හිටුවීම සහ බැහැර කිරීම සඳහා සභාව විසින් අවසර ලබාදිය යුතු බැවින් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල බලපත්‍ර ලිපි ගොනු වසා දමා තිබුණු එක්ස් කිරණ උපකරණ 27 ක් සම්බන්ධයෙන් බැහැර කිරීම සඳහා අයදුම්කරන තෙක් | එක්ස්-කිරණ පහසුකමක් සඳහා බලපත්‍රයක් ලබා දෙනුයේ එම යන්ත්‍රය සවිකිරීමෙන් අනතුරුව එහි විකිරණ පරීක්ෂාවක් කර විකිරණ ආරක්ෂාව තහවුරු කරගත් පසුවය. ඒ සඳහා යන්ත්‍රය සවිකර ක්‍රියාත්මක තත්ත්වයේ තිබිය යුතුය. ඇසුරුම් තුල බහා ඇති හෝ ගබඩා කර ඇති එක්ස්-කිරණ යන්ත්‍ර සඳහා නියාමන සභාව විසින් බලපත්‍ර ලබා දෙනු නොලබයි. එබැවින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාදාමය යටතේ අදාල මුදල් අය කිරීමක් සිදුකල නොහැකිය. කෙසේ වුවද විගණන නිරීක්ෂණ පරිදි සන්තකයේ තබා ගැනීමට බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාදාමය පිළිබඳව වැඩිදුරටත් සොයා බැලීමට බලාපොරොත්තු වේ. ලිපිගොනු වසා දමා ක්‍රියා පිළිවෙත අවසන් වූ එක්ස් කිරණ උපකරණ භාවිතා වූ ස්ථාන සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට ක්‍රමවේදයක් ඉදිරියේදී හඳුන්වාදෙනු ලැබේ. | එක්ස් කිරණ යන්ත්‍ර සන්තකයේ තබාගැනීම සඳහා බලපත්‍ර නිකුත් කල යුතුය.බලපත්‍ර ලිපිගොනු වසා දමා ඇති එක්ස් කිරණ උපකරණ බැහැර කිරීම සඳහා අයදුම්කරන තෙක් සන්තකයේ තබාගැනීම වෙනුවෙන් බලපත්‍ර නිකුත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සන්තකයේ තබාගැනීම සඳහා බලපත්‍ර ලබා දී නොතිබුණි. | | |
| (ii) 4(1)(ආ) රෙගුලාසිය | සාමාන්‍ය ජනතාව හෝ සේවකයින් සැලකිය යුතු තරම් උච්ච නිරාවරණයකට ලක්විය හැකි ස්වාභාවික විකිරණ ප්‍රභවයන් හා සම්බන්ධිත ක්‍රියාපිළිවෙත් සඳහා සභාව බලපත්‍ර ලබා දිය යුතු වුවත් විකිරණශීලී ඛනිජ වැලි ආශ්‍රිත කර්මාන්තයේ නියුතු ආයතන විසින් සිදුකරන ඛනිජ නිධි කැණීම, පිරිසැකසුම, ගබඩාකිරීම සහ විකිණීම ආදී ක්‍රියාපිලිවෙත් සඳහා සභාව විසින් බලපත්‍ර ලබා දී නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පරිදි අදාල ස්ථාන වෙත බලපත්‍ර ලබා දීමට හැකියාවක් තිබේදැයි සොයා බලා අවශ්‍ය කටයුතු සකස් කිරීමට නියාමන සභාව ඉදිරියේදී බලාපොරොත්තු වේ. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) 22 (ඇ) හා 27 ( එ) (ඒ) සහ 34 (ඇ) රෙගුලාසි | ස්වකිය ස්ථිර සේවකයින් නොවන්නාවූ සේවකයින් හෝ පූර්ව රැකියාවන්හිදී වෘත්තිය නිරාවරණයන්ට ගොදුරු වූ සේවකයින් යොදවා ගැනීමේ පූර්ව කොන්දේසියක් වශයෙන් මෙකී රෙගුලාසිවලට අනුකූලව සුරක්ෂණය හා ආරක්ෂාව සැපයිම සඳහා එබඳු සේවකයින්ගේ පූර්ව වෘත්තීය නිරාවරණ ඉතිහාසය හා සෞඛ්‍ය වාර්තා ඇතුළු වෙනත් තොරතුරු අවශ්‍ය පරිදි ලබාගත යුතු අතර සෑම විකිරණ ආරක්ෂණ නිලධාරියෙකු විසින්ම සියලුම විකිරණ සේවකයින්ගේ සෞඛ්‍ය වාර්තා පවත්වාගැනීම විකිරණ සේවකයින්ට පුහුණුව හා උපදෙස් ලබාදිම සහ ලබාදුන් පුහුණුව පිළිබඳ වාර්තා තබාගැනීම අනිවාර්යය වුවත් සමාලෝචිත වර්ෂයේදී විගණනයට ලක්කල බලපත්‍රලාභී ආයතන 5 ක් විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.එසේ වුවද ඒ සම්බන්ධයෙන් අවධානය යොමු නොකර සභාව විසින් බලපත්‍ර අළුත්කර තිබුණි. | විගණනයට ලක් කල බලපත්‍රලාභි ආයතන මධ්‍යම අවධානමක් සහිත පහසුකම් (Medium Risk Facility) වේ. එනම් එම පහසුකම් වලට සාපේක්ෂව ඔවුන් විසින් පවත්වා ගත යුතු වාර්තා හා තොරතුරු පිලිබඳ අවධානය යොමු කර හා යම් අඩුපාඩුවක් තිබේ නම් ඒවා සම්පූර්ණ කර ගැනීමේ පදනම මත නියාමන සභාව බලපත්‍ර අලුත් කර ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (iv) 27 (ඇ) (ii) රෙගුලාසිය | බලපත්‍රලාභී ආයතන විසින් සියලු විකිරණ සේවකයින්ට පිරිස් මන්ත්‍රකරණ උපකරණ ලබා දිය වුවත් ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කල ආයතන 4 ක් විසින් එහි විකිරණ ආශ්‍රිතව කටයුතු කරන සේවකයින් සඳහා පිරිස් මන්ත්‍රකරණ උපකරණ ලබා දීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අවධානය යොමුනොකර සභාව විසින් බලපත්‍ර අළුත්කර තිබුණි. | මේ සම්බන්ධයෙන් බලපත්‍රලාභීන් ලිඛිතව දැනුවත් කර සෝදිසි පරීක්ෂණවලදීද මේ පිළිබඳ සොයා බලයි. කෙසේ වුවද විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක්කර තිබූ ආයතන වලට පිරිස් මන්ත්‍රකරණ උපකරණ ලබා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (v) 37 (ඉ) රෙගුලාසිය | සෑම විකිරණ උපකරණයකම විකිරණ අනතුරු ඇඟවීමේ සංකේතය හෝ අනතුරු ඇඟවීමේ සංඥා ප්‍රදර්ශනය කළ යුතු වුවත් නියැඳි ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කල ආයතන විසින් එලෙස අනතුරු ඇඟවීමේ සංඥා ප්‍රදර්ශනය කර නොතිබුණු අතර බලපත්‍ර කොන්දේසි ප්‍රකාරව වලංගු බලපත්‍රය ආයතනික පරිශ්‍රයේ ප්‍රදර්ශනය කර නොතිබුණි. | බලපත්‍රයක් අලුත් කිරීමේදී එම සංකේතය ප්‍රදර්ශනය කර නොතිබුනේ නම් එය ප්‍රදර්ශනය කලයුතු බව පදනම් කරගනිමින් මෙම බලපත්‍රය නිකුත් කර ඇත. ඉදිරියේදී බලපත්‍ර අලුත් කිරීමකදී ඉහත සඳහන් විකිරණ අනතුරු ඇඟවීමේ සංකේතය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කල යුතු බව අදාල ආයතන වලට දැනුම්දීමට නියාමන සභාව අපේක්ෂා කරයි. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 09 (ආ) වගන්ති | චක්‍රලේඛ විධි විධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී පුහුණු වැඩසටහන් 4 ක් සඳහා තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස එකතුව රු.797,000 ක් ගෙවා තිබුණි. | අදාල චක්‍රලේඛය අනුව මාණ්ඩලික නිලධාරියකුට එක් අවස්ථාවකදී රු.100,000. ක උපරිමයක් දක්වා පමණක් අතුරු අග්‍රිමය ලබා දිය යුතු අතර, එම මුදල ඉක්මවන අවස්ථාවේදී ගණන් දීමේ නිලධාරියා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මඟින් මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතු බව දක්වා ඇත. නමුත් එහි එක් කාර්යයක් සඳහා වෙන් වෙන් දින කිහිපයක් අත්තිකාරම් මුදල් ලබා ගැනීමට නොහැකි බව දක්වා නොමැත. මෙයද මාණ්ඩලික නිලධාරියා විසින් වරකට රු.100,000 ක මුදලක් හා රු.100,000 කට වඩා අඩුවෙන් මුදල් ඉල්ලුම් කර ඇති හෙයින් 01/2020 රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 09 (ආ) අනුව එම මුදල නිකුත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 29.7 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 8.9 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 20.8 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී රජයේ පුනරාවර්තන ප්‍රදාන ලෙස රු. මිලියන 41 ක් ලැබීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන විෂයයන්වල විචලතා විශ්ලේෂණය

| මූල්‍ය ප්‍රකාශන අයිතමය | 2023<br>රු. මිලියන | 2022<br>රු. මිලියන | විචලනය<br>රු.මිලියන | විචලන ප්‍රතිශතය<br>% |
|---|---|---|---|---|
| බලපත්‍ර ගාස්තු ආදායම | 19.4 | 18.2 | 1.2 | 6.6 |
| ආනයන අපනයන අවසරපත් ආදායම් | 5.09 | 4.63 | 0.46 | 9.9 |
| පුහුණු පාඨමාලා ගාස්තු ආදායම් | 2.42 | 1.15 | 1.27 | 110 |
| කාමර සැලසුම් අනුමත කිරීමේ ගාස්තු | 1.03 | 0.97 | 0.06 | 6.2 |
| වැටුප් වියදම් | 20.4 | 24.13 | 3.73 | 15.4 |
| ඉන්ධන වියදම් | 2.25 | 1.21 | 1.04 | 86 |
| වත්කම් නඩත්තු වියදම් | 4.48 | 3.11 | 1.37 | 44 |
| මුළු වත්කම් | 162 | 119.3 | 42.7 | 35.7 |
| මුළු හිමිකම් | 128.2 | 86.7 | 41.5 | 47.8 |

### 2.3 අනුපාත විශ්ලේෂණය

| අනුපාතය | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1.08 | 0.69 | 1.43 | 0.62 | 1.26 |
| මුළු වත්කම් ප්‍රතිලාභ අනුපාතය | 18.3% | 7.45% | 11.2% | (5.82%) | (11.56%) |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කලමනාකරණ කටයුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 අංක 14 දරන පරමාණුක බලශක්ති පනතේ 12(ඉ), 59(2) හා 60 වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකාව අත්සන් කර ඇති න්‍යෂ්ටික ආයුධ පැතිරීම වැළැක්වීම පිලිබඳ සම්මුතිය යටතේ වන අතිරේක චර්යා ගිවිසුම (additional protocol) විධිමත් ලෙස බලාත්මක කිරීම සඳහා ඊට අදාල ශ්‍රී ලාංකීය ව්‍යවස්ථාපිත කාරණා ඉටුකරගන්නා තුරු ආකෘති අතිරේක චර්යා ගිවිසුම ශ්‍රී ලංකාව තුල කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට | අතිරේක ප්‍රොටෝකෝලය අත්සන් තැබීමට 2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත සංශෝදනය කිරීම අවශ්‍යය වේ. නියාමන සභාව විසින් අළුතින් බඳවාගත් නීති නිලධාරිනිය සම්බන්ධ කර ගෙන මෙම අතිරේක ප්‍රොටෝකෝලය අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු අනෙකුත් | ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති අන්තර්ජාතික ගිවිසුම්වල වගකීම් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2018 අප්‍රේල් 03 දිනැති අංක 18/0522/727/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී තිබුණද ඊට අවශ්‍ය ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සම්පූර්ණ කර නොතිබුණි. එසේම උක්ත සම්මුතියේ 39 ව්‍යවස්ථාව අනුව ගිවිසුමේ වගකීම් කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට අනුබද්ධ විධිවිධානයන් සවිස්තරාත්මකව ශ්‍රී ලංකාව විසින් සකස් කළ යුතු වුවත් 2019 වර්ෂයෙන් පසු ඒ සඳහා සභාව විසින් මැදිහත් වීම් කර නොතිබුණි. | පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කරමින් පවතී. එසේම ශ්‍රී ලංකාව විදුලිය නිපදවීමේදී න්‍යෂ්ටික බලය යොදා ගැනීම සඳහා අවශ්‍ය නව පනතක් සෑදීම සඳහා ගරු අධිකරණ අමාත්‍යවරයා විසින් කමිටුවක් පත්කර ඇත. | |
| (ආ) | පනතේ 18 වගන්තිය ප්‍රකාරව පරමාණුක බලශක්ති මණ්ඩලයද ඇතුළුව සියළු තැනැත්තන් විසින් සිදුකරන අයනීකාරක විකිරණ සම්බන්ධිත සෑම ක්‍රියා පිළිවෙතක්ම (Practices) බලපත්‍ර ලබා දී නියාමනය කිරීමේ වගකීම සභාව සතුය.ඒ අනුව මණ්ඩලය විසින් සපයන විකිරණශීලීතා මට්ටම් මිනුම් කිරීම, විකිරණ මිනුම් උපකරණ ක්‍රමාංකන සේවය, මාත්‍රා මිතික සේවය සහ වැඩබිම් අධීක්ෂණ සේවා වැනි සේවාවන් අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පනතේ 12(ඕ) වගන්තියේ බලතල ප්‍රකාරව සභාව විසින් කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් සකස්කළ යුතු වුවත් සභාව විසින් එවැනි කාර්ය පටිපාටි සහ යාන්ත්‍රණයක් පිළියෙල කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පනත ප්‍රකාරව මූලිකවම සකස් කල යුතු රීති, ප්‍රතිපත්ති හා රෙගුලාසි කිහිපයක් විගණනයෙන් පෙන්වා දුන් පරිදි පනතේ 12 (ඕ) වගන්තිය ප්‍රකාරව සකස් කල යුතු කාර්ය පටිපාටිය සහ යාන්ත්‍රණයද ඇතුලත්ව කෙටුම්පත් කරමින් පවතී. මෙම රීති, රෙගුලාසි සකස් කර අවසන් වූ පසු පනත අනුව සකස් කළ යුතු අනෙකුත් රීති, රෙගුලාසි සහ නියමයන් සෑදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. සීමිත සේවක සංඛ්‍යාවක් ඇති බැවින් දෛනික රාජකාරි අතරතුර මෙම රෙගුලාසි සහ නියමයන් සකස් කිරීම නියාමන සභාවට විශාල අභියෝගයක් වී ඇති බව | පනතේ වගන්ති ප්‍රකාරව අයනීකාරක විකිරණ සම්බන්ධිත සියළු ක්‍රියාපිළිවෙත් නියාමනය කල හැකි පරිදි අවශ්‍ය යාන්ත්‍රණයක් කඩිනමින් සකස් කළ යුතුය. |
| (ඇ) | පනතේ 46 වගන්තිය ප්‍රකාරව හිමිකම් නොමැති විකිරණශීලී ප්‍රභවයන් පිළිබඳ පාලනය නොපමාව ලබාගැනීම හෝ නැවත ලබාගැනීම සඳහා ජාතික ක්‍රමෝපායක් සකස් කළ යුතු වුවත් එවැනි ජාතික ක්‍රමෝපායක් සකස් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පනත ප්‍රකාරව මූලිකවම සකස් කල යුතු රීති, ප්‍රතිපත්ති හා රෙගුලාසි කිහිපයක් සමඟ මෙම ක්‍රමෝපාය සකස් කරමින් පවතින අතර සීමිත සේවක සංඛ්‍යාවක් සමඟ දෛනික රාජකාරි අතරතුර මෙම රෙගුලාසි සහ නියමයන් සකස් කිරීම නියාමන සභාවට විශාල අභියෝගයක් වී ඇති බවද දන්වා සිටිමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | පනතේ 48 (2) (අ) වගන්තිය ප්‍රකාරව කටයුතු කර විකිරණශීලී ප්‍රභවයන් අපනයනය කිරීමට අනුමැතියන් දීම සඳහා යොදාගත යුතු අවශ්‍යතා | විකිරණශීලී ද්‍රව්‍ය ප්‍රවේශම් සහිතව ප්‍රවාහනය කිරීමට අදාල රීතියේ අවසන් කෙටුම්පත සකස් කොට | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහ කාර්යපටිපාටිය ජාත්‍යන්තරව පිළිගත් මාර්ගෝපදේශ පදනම් කරගනිමින් රීති වශයෙන් සකස් කර 87 (3) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් 2024 මාර්තු වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | ක්ෂක අධ්‍ය දින පැවැති 2024.04.30 මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා .ගන්නා ලදීඅදාල පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා අනුව සකස් කිරීමට බලාපොරොත්තු වන කෙටුම්පත ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ විශේෂඥයින්ගේ සමාලෝචනයෙන් පසුව පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගෙන රීතිය සකස් කොට අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ඉ) | පනතේ 49 වගන්තිය ප්‍රකාරව ආනයනය හා අපනයනය කරන න්‍යෂ්ටික ද්‍රව්‍ය, උපකරණ සහ තාක්ෂණයන් පිළිබඳ ලැයිස්තුවක් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් සහ එකඟවීම් වලට අනුකූලව සභාව විසින් පිළියෙල කරනු ලැබිය යුතු අතර සභාව තීරණය කරන ආකාරයට එම ලැයිස්තුවට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබාදී ගැසට් පත්‍රයේ පළ කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි | පනතේ 49 වගන්තිය ප්‍රකාරව න්‍යෂ්ඨික ද්‍රව්‍ය උපකරණ හා තාක්ෂණයන් පාලිත අයිතමයින් වන අතර එය අතිරේක ප්‍රොටෝකෝලයේ සඳහන් වන පාලිත අයිතමයන් වේ. අතිරේක ප්‍රොටෝකෝලය මේ වන තෙක් ශ්‍රී ලංකාව අත්සන් තබා නොමැත. මෙම ලැයිස්තුව පිලියෙල කල හැක්කේ මෙම අතිරේක ප්‍රොටෝකෝලය අත්සන් කිරීමෙන් පසුව බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | පනතේ 69 (1) වගන්තිය ප්‍රකාරව අයනීකාරක ද්‍රව්‍ය උපද්දන කැණීම් හා පිරිසැකසුම් මෙහෙයුම්වලට අදාල ක්‍රියාකාරකම් පවත්වන සියලු පුද්ගලයන් විසින් අනුකූලතාව දැක්විය යුතු කම්කරුවන් මහජනයා සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතා සභාව විසින් තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මඟින් පැනවිය යුතු අතර 69(2) වගන්තිය ප්‍රකාරව ඊට අනුගත නොවන තැනැත්තන් දඬුවම්වලට යටත් කල යුතුය. කෙසේවෙතත්, 2024 මාර්තු වන විටත් සභාව විසින් ඒ සඳහා අවශ්‍ය රීති පිළියෙල කර නොතිබුණි. | මෙම රීතිය කෙටුම්පත් කිරීමට නියෝජ්‍ය අධ්‍යක්ෂවරු දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර මූලික කෙටුම්පත සකස් කිරීම ආරම්භ කොට ඇතකෙටුම්පත මෙම . හා අවසන් කිරීමෙන් පසු භූ විද්‍යා පතල් කැනීම් කාර්යාංශයේද අදහස් හා යෝජනා ලබාගෙන ඉදිරි කාලයේදී මෙම රීතිය අවසන් කර බලාත්මක කිරීමට නියාමන සභාව බලාපොරොත්තු වේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | පනතේ 86 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රවිකිරණ කාර්මික අනු ආයතන අක්‍රීය කිරීම සඳහා සහ විකිරණ සේවකයින් අහිතකර අයනීකාරක විකිරණයට නිරාවරණය වීම හේතුවෙන් සිදුවන රෝග හෝ අලාභ වෙනුවෙන් එම සේවකයින්ට වන්දි ගෙවීම සඳහා වන්දි යෝජනා ක්‍රමයක් සකස් කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සකස්කර නොතිබුණි. | 86 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රවිකරණ කාර්මික අනු ආයතන අක්‍රීය කිරීම සඳහා වන නියෝගය දැනටමත් කෙටුම්පත් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත් විකිරණ ආරක්ෂණ රෙගුලාසියට ඇතුලත් කර ඇත. මෙම රෙගුලාසිය පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ලබා ගත් පසු නියමිත | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ක්‍රමවේදයන් අනුගමනය කරමින් බලාත්මක කිරීමට නියාමන සභාව බලාපොරොත්තු වේ. | |
| (ඌ) පනතේ 87(1) (ඇ) වගන්තිය ප්‍රකාරව විකිරණ සේවකයන්ගේ සුදුසුකම් සඳහා උපමාන අවශ්‍යතා සඳහා වන රීති සකස් කර නොතිබුණි. | 87 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව සකස් කල යුතු විකිරණ සේවකයන්ගේ සුදුසුකම් සඳහා උපමාන රීතිය සමඟ පනත අනුව සකස් කළ යුතු අනෙකුත් රීති, රෙගුලාසි සහ නියමයන් සෑදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් කටයුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනතේ 12 (ග) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහ මෙරටදී ලබාගත හැකි යම් භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය පරීක්ෂාකිරීම (inspect), විකිරණශීලීතාවය පිරික්සීම සඳහා සාම්පල් ලබාගැනීම සහ සභාව අවශ්‍ය යැයි හෝ යෝග්‍යයැයි සලකන අවස්ථාවක ඒ පිරික්සුමේ ප්‍රතිඵල මහජනයාගේ සහ අදාල සියලු නිලධාරීන්ගේ දැනගැනීම පිණිස පළකිරීම සිදුකල යුතු වුවත් සභාව විසින් ආනයනික කිරිපිටි හැර අනෙකුත් විකිරණශීලී ද්‍රව්‍ය පැවතිය හැකි ආනයනික පාරිභෝගික ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා වන අහඹු පරීක්ෂාවන් හෝ සිදුකර නොතිබුණි. | මෙම පරීක්ෂාවන් සිදු කරනු ලබන්නේ පරමාණුක බලශක්ති මණ්ඩලය වන අතර, සභාව විසින් උචිත පරිදි අහඹු පරීක්ෂාවන් සිදුකරනු ලබයි.ඒ අනුව තෝරාගත් දිස්ත්‍රික් හතරකින් පාරිභෝගික කිරිපිටි සාම්පල් අහඹු ලෙස පරමාණුක බලශක්ති මණ්ඩලය වෙතින් පරීක්ෂා කළ අතර එහි වාර්තා අමාත්‍යාංශය හා විගණකාධිපති වෙත දැනටමත් ලබා දී ඇති බව දන්වා සිටිමි. | අවධානම් සහිත සෙසු සියළු ආහාර වර්ග අහඹු ලෙස පරීක්ෂා කළ යුතුය. |

## 3.3 මතභේදයට තුඩු දෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනතේ 30 (2) වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභියෙකු බලපත්‍රය අවසන් වීමේ දිනයට පෙර බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට අසමත් වන අවස්ථාවක, එම බලපත්‍රය අවසන් වූ වහාම අදාල පරිශ්‍රයට මුද්‍රා තැබීමට සැලැස්වීම සහ ඒ මුද්‍රා තැබීමෙන් දින 7 ක් ඇතුළත පරිශ්‍රයට මුද්‍රා තැබීම තහවුරු කිරීමේ ආඥාවක් ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ විකිරණශීලි ප්‍රභවයේ ප්‍රවේසම සහ සුරක්ෂිතතාවය තහවුරු කළ හැකි ආකාරය සම්බන්ධයෙන් සහ මිනිස් ජීවිතවල සහ පරිසරයේ ආරක්ෂාව සඳහා යෝග්‍යයැයි සභාව සලකන බලපත්‍රලාභියා විසින් තරයේ පිළිපැදිය යුතු විධාන නිකුත් කල යුතු වුවද, ඒ අනුව කටයුතු කිරීමකින් තොරව නියැදි විගණන පරීක්ෂාවට ලක් කල ස්ථාන 5 ක් සඳහා 2024 ජනවාරි 1 සිට 2024 මැයි 31 දක්වා තාවකාලික බලපත්‍ර 5 ක් නිකුත් කර තිබුණි. සභාව විසින් පනතේ 28(2) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව තාවකාලික බලපත්‍ර නිකුත්කර තිබීමෙන් පනතේ 30 (2) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම වලක්වා තිබුණි. තාවකාලික බලපත්‍ර නිකුත්කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳව පනතේ 28 (2) වගන්තියේ පැහැදිලි කිරීම් දක්වා නොමැති බැවින් ඒ සඳහා පනතේ 86 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නියෝග සකස් කළ යුතු නමුත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත මාර්ගෝපදේශ පමණක් ඒ සඳහා භාවිතා කර තිබුණි. | පනතේ (2) 30වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභියෙකු බලපත්‍රයක් අවසන් වීමේ දිනට පෙර බලපත්‍රයක් අළුත් කිරීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට අසමත් වූ විට එම බලපත්‍රය අවසන් වූ වහාම අදාල පරිශ්‍රයට මුද්‍රා තැබීමට සැලැස්වීමේ ක්‍රියාදාමය නියාමන සභාවට සිදු කල හැකි නමුත් පනතේ (2) 28වගන්තිය ප්‍රකාරව බලපත්‍රලාභියා විසින් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමට අසමත් වුවද එම බලපත්‍රලාභියා විසින් බලපත්‍රය අළුත් කිරීමට අදහස් කරන්නේ නම් සභාව විසින් නොපමාව එම බලපත්‍රලාභියා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට යොමු කළ යුතු අතර බලපත්‍රය අළුත් කිරීම අවසන් වන තෙක් නියාමන සභාව විසින් බලපත්‍රලාභියාට තාවකාලික බලපත්‍රයක් නිකුත් කල හැකි ය.දැනට තාවකාලික බලපත්‍රයක් නිශ්චිත ක්‍රමවේදයක් යටතේ නිශ්චිත කාලසීමාවකට නිකුත් කරන අතර සියළු බලපත්‍ර ගාස්තු ගෙවීමෙන් පසුව පමණක් ඉතිරි බලපත්‍ර කාල සීමාව දක්වා බලපත්‍ර දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ. තවද තාවකාලික බලපත්‍රයක බලපත්‍ර කාලය සහ බලපත්‍ර නිකුත් කල යුතු අවස්ථා නියාමන සභාව විසින් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත මාර්ගෝපදේශයක් වන අවසර ලබාදීමේ ක්‍රමවේදයෙහි (Procedure for Authorization) පැහැදිලිව සටහන්ව ඇත. | තාවකාලික බලපත්‍ර නිකුත්කිරීමට අදාලව නියෝග සකස් කර නොමැති බැවින් මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය විමසා ඒ අනුව ඉදිරි කටයුතු සිදුකල යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 06 ක්ද, තෘතීක මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 4 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 05 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 3 ක්ද ලෙස නියාමන සභාවේ සමස්ථ | පුරප්පාඩු පිරවීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට අපොහොසත්විය. නමුත් 2023 වර්ෂයේ දෙසැම්බර් අග වන විට පුරප්පාඩුව පවැති නියෝජ්‍ය අධ්‍යක්ෂක,අභ්‍යන්තර විගණක, | සභාවේ අරමුණු ළඟාකරගත හැකි ආකාරයට කටයුතු කිරීමට ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් බඳවාගැනීමට |

| | | |
|---|---|---|
| පුරප්පාඩු 18 ක් පැවතුණි. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 40 ක් වැනි ඉහළ ප්‍රමාණයක් වීම හේතුවෙන් කාර්යක්ෂම සහ ඵලදායී නියාමන පාලන තන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම මගින් අයනිකාරක විකිරණවලින් ඇති විය හැකි අහිතකර බලපෑම් වලින් ජනතාව ආරක්ෂා කිරීමට බාධාවක් වී තිබුණි. | පරිපාලන නිලධාරී, කළමනාකරණ සහකාර තනතුරු 04 සහ විද්‍යාත්මකනිලධාරි තනතුරු 03කි පිරවීම සඳහා අනුමැතිය ලැබී 2024 මුල් කාර්තුවතුල බඳවා ගැනීම් සිදුකර ඇත .තවද අනුමත ඉතිරි සේවක පුරප්පාඩු පිරවීම සඳහාද දැනටමත් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉල්ලීමක් කර ඇත. | කටයුතු කල යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 16 ක අයවැය ගත වියදම හා සත්‍ය වියදම අතර සියයට 35 සිට සියයට 100 දක්වා විචලනයන් වූයෙන් අය වැය ඵලදායී පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබුණි. | අනපේක්ෂිත සේවක ඉවත්වීම් රජයේ වියදම් කළමනාකරණ චක්‍රලේඛ සහ වෙනත් බාහිර හේතු සාධක වල බලපෑම හේතුවෙන් මෙම තත්ත්වය සිදුව තිබේ. | අයවැය ලේඛණය ඵලදායී පාලන උපකරණයක් ලෙස යොදා ගත හැකි පරිදි විචක්ෂණශීලී ලෙස පිළියෙල කළ යුතුය. |